# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 47 — 1973 පෙබරවාරි 15 වැනි බ්‍රහස්පතින්ද — 1973.02.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 225 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 238 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට කිම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 233 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 241 |


සැළකිය යුතුයි.—පොදු පහසුකම් මණ්ඩල පනතත් කෙටුම්පත සහ බද්ධ නිවාස අයිතිකම් පනතත් කෙටුම්පත 1973 පෙබරවාරි 02 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. 1973. 3. 1 සිට 1973. 12. 31 දක්වා මෙරට සෑදූ කාර්යාලයීය ඇමුණුම් කටු සහ ඇල් පෙනෙත්ති සැපයීම | ... | 1973. 3. 9. |
| 2. මෙරට සෑදූ පොළොව ඔපකරණ ද්‍රව්‍ය සැපයීම | ... | 1973. 3. 15. |

පොළොව ඔපකරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973. 2. 15 දින,
කොළඹ දී ය.

2–609—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවට අයත් හිස් සිමෙන්ති උර 12,934 ක් (3,000 හේ ගොඩවල් 3 ක් සහ 3,934 රේ එක් ගොඩකින් යුත්) විකිණීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 මාර්තු 8 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. සතියේ දිනවල පෙ. ව. 9 සිට ප. ව. 3 දක්වාද, සෙනසුරාදා දිනවල පෙ. ව. 9 සිට පෙ. ව. 11 දක්වාද, ප්‍රමාණ පත්‍රයේ දක්වා ඇති පරිදි, මෙම සිමෙන්ති උර පරීක්ෂාකර බැලිය හැකිය.

1973 මාර්තු මස 8 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටීන්ට අවසර දෙනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව ඒම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කොළඹ වරාය කොමිෂන් සභාවේ සරප් තැනගෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1973 මාර්තු මස 06 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

සී. ලුඩිකන්ස්,
වරාය කොමසාරිස්.

1973.02.15 දින,
කොළඹ 1,
වරාය කොමිෂන් සභා කායසීලයේ දීය.

2–546—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පර්යන්ත ගොඩනැගිල්ලට ඉතා නුදුරුව ඇති ගරාජය පිහිටි භූමි භාගයේ සේවක ආපන ශාලාවක් පවත්වාගෙන යෑම සඳහා 1973 මාර්තු 5 වැනි දින පෙ. ව. 10 තෙක් කොළඹ 1, තැ. පෙ. 535, යන ලිපිනයේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ලිප් බැඳ ගිනි මෙලවීමට ඉඩ දෙනු නොලැබේ. ටෙන්ඩර් කරු විසින්ම සපයා ගන්නා ලද භූමිතෙල් ලිප්වලින් හෝ විදුලි ලිප් වලින් කෑම පිසීම කළ යුතු ය. දෙපාර්තමේන්තුව විසින් විදුලි බලය සපයනු ලැබේ.

2. ආහාරපානාදිය සැපයීමේ කොන්ත්‍රාත්තුව ආපන ශාලාව පටන් ගන්නා දින සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයකට පමණක් සීමා වේ.

3. ටෙන්ඩර්කරුවන් ආහාර පානාදිය සැපයීමේ කටයුත්තෙහි යෙදී යටත් පිරිසෙයින් පස් වර්ෂයක් වත් පළපුරුද්දක් ලබා සිටිය යුතුවාත් හැර තමන් සතු සම්පත් හා හැකියාව ගැන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැන සෑහීමට පත් කළ හැකි තත්ත්වයක සිටිය යුතු ය.

4. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගේ, අංක 3, ලෝටස් පාර, කොළඹ 1, කාර්යාලයෙන් හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ රු. 25 ක මුදලක් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973 මාර්තු 2 වැනි දින දහවල් 12තෙක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වල දෙපිටපතකින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

සී. ඩබ්ලිව්. ඇම්. අපොන්සො,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1973.02.06 දා,
තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.

2–543—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

වේදිකාකිරණ යන්ත්‍ර සහ රෙදි නැමීමේ හා මැණීමේ යන්ත්‍ර සැපයීම සඳහා, ඒවා නිපදවන්නන්ගෙන් හා ඔවුන්ගේ නියෝජිතයින්ගෙන්, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.05.15 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වැඩි විස්තර සහ ටෙන්ඩර් පත් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1—(3/23)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.02.02.

2–544—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුරුණෑගල කැඳ දැමීමේ ආයතනයේ දොරවල්වලට හා ජනෙල්වලට කම්බි දැල් ගැසීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.3.1 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 10,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973.2.28 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1/—(1/39)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.02.05.

2–657—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ජාතික කිරි මණ්ඩලය

### චීනච්චට්ටි ගල් අල්ලි සැපයීම

### මිල ගණන් කැඳවීමේ අංක : ඇම්පී ඇප් 22/73

පහත සඳහන් පිරිවිතර අනුව චීනච්චට්ටි ගල් අල්ලි 2,000 ක්, සැපයීම සඳහා කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ සභාපති විසින් 1973.02.28 දින පස්වරු 2.00 දක්වා, දේශීය සැපයුම් කරුවන්ගෙන් මුද්‍රාපිත මිලගණන් භාරගනු ලැබේ.

මෙම ගල් අල්ලි වාටිය රහිත 12″×12″×3/4″ ප්‍රමාණය විය යුතුය. ඒවායේ 3/4″ සිට 5/8″ දක්වා ක්‍රමිකව කුඩාවන (tapered) සිදුරු 64 ක් තිබිය යුතුය.

සැපයුම් කළමනාකරුගේ කාර්යාලයේදී සැම්පල් පරීක්ෂා කළ හැක.

මිලගණන් ඇතුළත් ලිපිකාවරය සිල් තබා, එහි වම්පස උඩ කෙළවරේ "චීනච්චට්ටි ගල් අල්ලි සඳහා මිලගණන් අංක : ඇම්පී. ඇප් 22/73" යන්න සඳහන් කොට, මිලගණන් භාරගන්නා අවසන් වේලාවට ප්‍රථමයෙන්, කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ සභාපති වෙත ලැබෙනසේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
නාරාහේන්පිට,
කොළඹ 5,
1973.02.01 දින.

2–385—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුව, විදින යන්ත්‍රයන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 10, දුම්රිය මූලස්ථානය, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1973 මැයි මස 24 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාර ගැනීමට හා හරියාකාරව ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා පිටපත් දෙකක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් මරදානේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිතැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිටත, ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 මැයි මස 19 වැනි සෙනසුරාදා දහවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 මැයි මස 24 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11.05 ට දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරිතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සජීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1973 ජනවාරි මස 26 වෙනි දින,
කොළඹ 10.

2-604—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### සුරාබදු දෙපාර්තමේන්තුව

#### හිස් වානේ බෙර විකිණීම සඳහා මිළ ගණන් කැඳවීම

ගැලුම් 46 ප්‍රමාණයේ (1) හොඳ තත්ත්වයේ හා (2) මඳක් තැලුණු හා/හෝ මලකඩ ඇල්ලූ තත්ත්වයේ වානේ හිස් බෙර විකිණීම සඳහා මුද්‍රා තැබූ මිළ ගණන් පත්‍ර 1973 මාර්තු මස 12 වැනි දින මධ්‍යාහ්න 12 දක්වා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් විසින් භාරගනු ලැබේ. ගැනුම්කරුවන් විසින් මිලට ගැනීමට අදහස් කරන ප්‍රමාණය හා 1 වැනි වර්ගයේ හිස් බෙරයකට හා 2 වැනි වර්ගයේ හිස් බෙරයකට ගෙවන මුදල කොපමණද යනුවෙන්වූ මිළ ගණන්ද වෙන වෙනම සඳහන් කළ යුතුය.

සාමාන්‍ය කාර්යාලීය වේලාවන් ඇතුළත මෙම හිස් බෙර කළුතර, සීදූව හා මහනුවර සුරාබදු ගුදම්වලදී පරීක්ෂා කළ හැකිය.

හේ. බ. විජේකෝන්.
සුරාබදු කොමසාරිස්.

1973 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දීය.

2-558—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

#### චීනන්වාඩියේ පිහිටි ටැංකිවලට (පාරක් තැනීම)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් සේවාව සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් බාර ගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු ටෙන්ඩර් කොන්දේසි නියමයන් හා සිතියම් ගබඩා හා සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

1973 මාර්තු මස 1 වෙනි දින පෙ.ව. 10 තෙක් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

2-625/1—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

#### පොළවයට ලෝහමය කේබල්ස් සැපයීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති විසින් ඉහත සඳහන් දේ සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු ටෙන්ඩර් කොන්දේසි සහ නියමයන් ගබඩා හා සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

1973 මාර්තු මස 1 වෙනි දින පෙ. ව. 10 තෙක් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

2-625/2—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

#### සපුගස්කන්ද පිරිපහදුවේ සිට කොලොන්නාව නිමාවට පූර්වන ලද ගැලුම් 35 තාර පීප්ප ප්‍රවාහණය කිරීම සඳහා මිළ ගණන් කැඳවීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1973 වර්ෂය තුල ඉහත සඳහන් දේ ප්‍රවාහනය කිරීම සඳහා සීල් තබන ලද මිළ ගණන් පත් භාර ගනු ලැබේ.

යටත් පිරිසෙයින්, ලොරි 3 ක් වත් හිමි අය පමණක් මිළ ගණන් පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. කොලොන්නාවේ නිමා කළමනාකාර තැනට අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුව ලැබූ අය විසින් දිනකට අඩුවශයෙන් පීප්ප 120 බැගින්වත් ප්‍රවාහණය කිරීමට සූදානමින් සිටිය යුතුය. කෙසේ වෙතත්, මෙතරම් පීප්ප තොගයක් නොකඩවා සැපයීමට සංස්ථාව සහතික නොවන අතර, කොලොන්නාව නිමාව කළමනාකාරගේ අවශ්‍යතා අනුව ඔහු විසින් නියම කරන පරිදි ඊට වඩා අඩු ගණනක පීප්ප ප්‍රවාහණය කිරීමට කොන්ත්‍රාත්තුව ලබන අයට සිදුවනු ඇත.

මිළ ගණන් සඳහන් කිරීම පීප්පයකට බැගින් වියයුතු අතර, ඊට පැටවීම් සහ බෑම් ගාස්තුව ද ඇතුළත් වියයුතු ය.

මිළ ගණන් පත් සීල් තබන ලද කවරයක බහා, ලියාපදිංචි කිරීමේ තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ගබඩා හා සැපයීම් කළමනාකාරගේ කාර්යාලයේ තැන්පත්කොට ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

1973 පෙබරවාරි 22 වෙනි දින පෙ. ව. 10 තෙක් මිළ ගණන් පත් භාර ගනු ලැබේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

2-625/3—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාර දෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළා සේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥා පණතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර කුණ්ඩසාලේ පළතුරු කර්මාන්ත ශාලාවේ භාරකාර නිලධාරිණියගෙන් දැනගත හැකිය.

හේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ. ගො.).

1973 ජනවාරි මස 31 වන දින,
පේරාදෙණියේ දීය

02–537—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවලට පැළකිරීම සඳහා ඇට ගැනීමට සුදුසු ඉදුනු වල් සහ කොනු අඹ සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර්

1973 ජනවාරි මස 26 වෙනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී ඇති ඉහත සඳහන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් දිනය 1973 පෙබරවාරි මස 28 වෙනි දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වමි.

එස්. තවරාජවේල්,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති,

1973.1.26,
ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, පළතුරු කම්හල පාර,
කොළඹ 5.

02–556—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරේ ඇති හිස් ගෝනි, හිස් ටින් ආදිය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත අත්සන් කරනු ලබන ම විසින් පල්ලේකැලේ, එළිමහන් සිර කඳවුරේ එකතුවී ඇති මෙහි පහත දැක්වෙන හිස් භාජන විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1973 මාර්තු මස 14 දින පෙ. ව. 10.30 දක්වා භාර ගනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| 1. | හිස් පිටි ගෝනි "දල්" | ... ... | 1,500 යි |
| 2. | හිස් පිටි ගෝනි "ඔරිජිනල්" | ... ... | 100 යි. |
| 3. | හිස් ලුනු ගෝනි | ... ... | 30 යි |
| 4. | හිස් රාත්තල් 1 කේ ජෑම් ටින් | ... | 200 යි |
| 5. | හිස් පිටි ගෝනි "ඔරිජිනල්" පලුදු | ... | 150 යි |
| 6. | හිස් බේකරි කොම්පවුන්ඩ් ගැලුම් 4 ටින් | ... | 10 යි |
| 7. | හිස් බේකරි කොම්පවුන්ඩ් රා. 56 ටින් | ... | 100 යි |
| 8. | හිස් කුකුල් කෑම මලු | ... ... | 250 යි |

2. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම් සඳහා මෙම කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 15 ක් තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන ලද රිසිට් පත ටෙන්ඩර පතට ඇමිණිය යුතුයි. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් සිය අත් අකුරෙන් ටෙන්ඩර් ලියා ඉදිරිපත් කළ යුතුය. යම් ටෙන්ඩරයක් භාර ගත් බව ලිපියකින් දන්වා දින 14 ඇතුළතදී එම ද්‍රව්‍ය වලට මිළ ගෙවා ඉවත් කර ගැනීමට නොහැකි වී නම්, හෝ ඉවත් කර ගැනීමේ කාර්ය පැහැර හැරියේ නම් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුලත් කරනු ලැබේ. ටෙන්ඩර් පත පිළිගත් බවට දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැව්නි නම් හෝ, එම ස්ථානයෙහි තබා ආවේනම් ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුනු සේ සලකනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ඇත.

3. ටෙන්ඩර්කරුවන් විසින් ද්‍රව්‍ය සියල්ලක්ම සඳහා මුලු තොගය වෙනුවෙන් ඒකාබද්ධ මිළක් සඳහන් කළ යුතුය. වැඩිම මිළ ඉල්ලුම් කරුට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. ටෙන්ඩර් පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම් පස ඉහල කෙලවරේ 'හිස් ගෝනි හිස් ටින් ආදිය සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පූ. භා. 8 සිට 11 සහ අ. භා. 1 සිට 3 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පූ. භා. 8 සිට 11 දක්වා ද පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරේ බන්ධනාගාර අධිකාරිගෙන් විමසීමෙන් පසු මෙම භාණ්ඩ පරීක්ෂා කළ හැක. ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩරයේ යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට 'ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි. විකිණීමට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය තෝරා වෙන්කර ඒ අනුව ඉදිරිපත් කරන මිල ගණන් බාරගනු නොලැබේ. සම්පූර්ණ තොගයටම ඒකාබද්ධ මිලක් දැක්විය යුතුය.

5. ටෙන්ඩර් පත් 1973 මාර්තු මස 14 වැනි දින පූ. භා. 10.35 ට පල්ලේකැලේ එළිමහන් සිරකඳවුරේ බන්ධනාගාර අධිකාරිගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැක.

6. වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම් පහත අත්සන් කර ඇති අයගෙන් විමසන්න.

පී. ඩබ්. පෙරේරා,
බන්ධනාගාර අධිකාරී.

එළිමහන් සිර කඳවුර. පල්ලේකැලේ,
කුණ්ඩසාලේ, 1973. 01. 22 වෙනි දින දීය.

02–586—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**වානේ සැපයීම සඳහා ටෙන්ඩරය**

1973 මාර්තු මස 27 දින පෙරවරු 10 දක්වා වානේ පොලු සැපයීම සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. අවශ්‍ය ටෙන්ඩර් පෝරම් කොළ රුපියල් 100 ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. අවලංගු කළ ටෙන්ඩර් පෝරම රුපියල් 10ක් ගෙවීමෙන් ලබාගත හැක. 1973 මාර්තු මස 26 දින දහවල් 12 න් පසු ටෙන්ඩර් තැන්පත් මුදල් භාරගනු නොලැබේ.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

02-622—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ප්‍රවාහන අංශයේ හා බොරැල්ලේ මුළු තැන් ගෙයෙහි ඇති පාවිච්චි කළ ද්‍රව්‍ය විකිණීම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 පෙබරවාරි මස 28 දින අ.භා. 2 දක්වා ටෙන්ඩර් පත භාර ගනු ලැබේ.

අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 පෙබරවාරි මස 28 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක.

වැඩි විස්තර ඉහත ලිපිනයේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගැනීමට පිළිවන.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි සංවර්ධන කොමසාරිස් වෙනුවට.

1973.02.05 වැනිදා,
කොළඹ 1, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

02-554—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ගමනාගමන මණ්ඩලය**

කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි ලංකා ගමනාගමන මණ්ඩලයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කළු හමෙන් නිමවුන පිරිමි පාවහන් සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1973 තේ මාර්තු මස 14 වෙනි දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් නියමිත පෝර්මවල ලියා අනුපිටපතකින්ද යුතුව එවිය යුතුයි. මෙම පෝර්මපත් වේරහැර, ලං.ග.ම. ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කායඝීලයෙන් කාර්යාලීය වේලාවන්හි 1973තේ මාර්තු මස 13 වෙනි දින දවල් 12 වනතෙක් ලබාගත හැක. පෝර්ම ලබා ගැනීමට වේරහැර ලං.ග.ම. නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ආපසු නොගෙවන රු. 10 ක ගෙවීමක් හා ආපසු ලබාගත හැකි රු. 100 ක තැන්පත් මුදලක්ද ගෙවා ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සි මෙම කායඝීලයට ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර මගේ කායඝීලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

වේරහැර,
බොරලැස්ගමුව,
1973ක්වූ පෙබරවාරි මස 01 වෙනි දින.

02-637— 73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සීඑස්/105.

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

රජයේ බෙහෙත් ගබඩාව—හිස් බෝතල් විකිණීම

ඉහත සඳහන් හිස් බෝතල් විකිණීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි විසින් 1973.02.22 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

කට පළල හිස් බෝතල් 2,000.

2. ඉහත සඳහන් හිස් බෝතල් බොරැල්ල ප්‍රැන්සිස් පාරේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේදී සෙනසුරාදා හා ඉරිදා දිනයන් හැර සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 8 සිට ප. ව. 3.30 දක්වා පරීක්ෂා කර බැලීමට පුළුවන.

3. ටෙන්ඩර්කරු විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට පිටපත් 2 කින් යුතුව මුද්‍රාව තබන කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම් පස උඩ කෙළවරේ "හිස් බෝතල් විකිණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. මරදාන ඩීන්ස් පාරේ අංක 355 දරණ ස්ථානයේ රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩරයට අමුනා එවිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍රයේ පළමු ඡේදයේ සඳහන් දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

6. කිසිම ප්‍රශ්නයක් නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් භාර ගැනීමේ හෝ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියක්ම නො පිළිපැද තිබුණොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නො ලැබේ.

7. තෝරුණු ටෙන්ඩර්කරු පිළිගත් බව දන්වා දින 7ක් ඇතුළතදී එම විෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිල ගණන් සම්පූර්ණයෙන්ම රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී වෙත ගෙවිය යුතුය. එලෙස මුදල් ගෙවා දින තුනක් ඇතුළතදී මේ විෂය භාරගෙන රජයේ බෙහෙත් ගබඩාවේ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

8. ඉහත සඳහන් 7 වන ඡේදයේ සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මරදාන ඩීන්ස් පාරේ 355 දරණ ස්ථානයේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරීගෙන් ලබාගත හැක.

ඩී. ඒ. ඒ. මුණසිංහ,
රජයේ බෙහෙත් ගබඩා අධිකාරි.

1973.01.11 දින,
කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවේදීය.

02-504—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**පිත්තල පොලු සැපයීම සඳහා ටෙන්ඩරය**

1973 මාර්තු මස 12 වැනි දින පෙරවරු 10 වන තෙක් පිත්තල පොලු සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. රු. 100 ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝරම කොළ මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට කලින් දින දහවල් 12 න් පසු භාරගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රුපියල් 5 ක් ගෙවීමෙන් ලබාගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

02-634—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**ලියවන පට්ටල් සඳහා අවශ්‍ය චක් ස් (LATHE CHUCKS) ආදිය සඳහා ටෙන්ඩරය**

1973 අප්‍රේල් මස 4 දින පෙරවරු 10 දක්වා ලියවන පට්ටල් වැඩ සඳහා අවශ්‍ය චක් ස් (LATHE CHUCKS) ආදිය සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. රුපියල් 100 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම කොළ මෙම කාර්යාලයෙන් ලබාගත හැක. අවලංගු කළ ටෙන්ඩර් පෝරම් රුපියල් 10 ක් ගෙවීමෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පෙර දින දහවල් 12 න් පසු භාරගනු නොලැබේ.

මිළට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

2–633—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

**කොළඹ ප්‍රදේශයෙහි ගොඩනැගිලිවලට අලුතෙන් කොටස් එකතුකිරීම, ඒවා වැඩිදියුණු කිරීම, නඩත්තු කිරීම සහ ගොඩනැගිලි තැනීමේ කටයුතු උදෙසා ගොඩනැගිලි ද්‍රව්‍යය සැපයීම**

කොළඹ නැගෙනහිර සහ කොළඹ බටහිර දිස්ත්‍රික්කවල, ඩිපෝවලට සහ ගොඩනැගිලි තනනු ලබන ස්ථානවලට, පහත සඳහන් ප්‍රමාණවලින් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම පිණිස කොළඹ 7, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කොළඹ කොට්ඨාසයේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයේ කොට්ඨාස ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින්, 1973 පෙබරවාරි 28 වැනි බදාදා ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ඇත.

2. කොළඹ 7, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කොළඹ කොට්ඨාසයේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ලියා ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. එකී අධිකාරී ඉංජිනේරුගෙන් මේ සම්බන්ධයෙන් සියලු විස්තර ලබාගත හැකිය. කොළඹ කොට්ඨාසයේ අධිකාරී ඉංජිනේරු තැන වෙත 1973 ජනවාරි 15 වැනිදා දක්වා ලියාපදිංචි වූ ටෙන්ඩර් කරුවන්ට පමණක් ටෙන්ඩර ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. ලියාපදිංචි කරන ලද ටෙන්ඩරකරුවන්ගේ නාම ලැයිස්තුවක්, සාමාන්‍ය වැඩකරන කාල වේලාවන්හිදී ඉහත සඳහන් කාර්යාලයෙහිදී බලාගත හැකිය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1973 පෙබරවාරි 26 වැනි සඳුදා ප.ව. 2.30 තෙක් ය.

3. ටෙන්ඩර, ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් කොළඹ 7, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කොළඹ කොට්ඨාසයේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. මුද්‍රා තබන ලද ලියුම් කවරවල බහා ටෙන්ඩර එවිය යුතුය. ලියුම් කවරයෙහි මුදුනේ වම් කෙළවරේ " ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩරය " යනුවෙන් ලියා සළකුණු කළ යුතුය.

4. 1973 මාර්තු 5 වැනි සඳුදා පෙ.ව. 9.30 ට ටෙන්ඩර විවෘත කරනු ඇත. ටෙන්ඩර විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩරකරුවන්ට හෝ ඔවුන්ගේ පිළිගත් නියෝජිතයින්ට හෝ එහි ඇවිත් සිටිය හැකිය.

5. පිළිගැනීමේ ලිපිය ලැබී සතියක් ඇතුළත ද්‍රව්‍ය සැපයීම අරඹා, සතර මසක් ඇතුළත ගොඩනැගිලි ද්‍රව්‍ය භාරදීමට සාර්ථක ටෙන්ඩරකරුවන්ට හැකි විය යුතුය. ඇණවුම් කරන ලද පරිදි ද්‍රව්‍ය සැපයීම ප්‍රතික්ෂේප කරන නැතහොත් එසේ සැපයීමට නොහැකි වන සාර්ථක ටෙන්ඩරකරුවන්ගේ නම් රජයේ කොන්දේසි කඩකරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබීමට ඉඩ ඇත.

6. ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ අර්ධ වාර්ෂික අවශ්‍ය ප්‍රමාණ පහත සඳහන් පරිදිය :—

| | ද්‍රව්‍ය | මිම්ම | කොළඹ නැගෙනහිර | කොළඹ බටහිර |
|---|---|---|---|---|
| 1. | ගඩොල් ... | ... ගණනින් ... | 1,50,000 ... | 75,000 |
| 2. | ගංවැලි ... | ... කියුබ් ... | 1,500 ... | 750 |
| 3. | දියගැසූ හුණු | ... බුසල් ... | 2,000 ... | 750 |
| 4. | තැම්බූ හුණු | ... බුසල් ... | 750 ... | 750 |
| 5. | 6"—9" රළුගල් | ... කියුබ් ... | 20 ... | 30 |
| 6. | 4 "කළුගල් කැට | ... කියුබ් ... | 20 ... | 30 |
| 7. | 2" කළුගල් කැට | ... කියුබ් ... | 75 ... | 75 |
| 8. | 1" කළුගල් කැට | ... කියුබ් ... | 75 ... | 75 |
| 9. | 3/4" කළුගල් කැට | ... කියුබ් ... | 75 ... | 75 |
| 10. | 1/2" කළුගල් කැට | ... කියුබ් ... | 20 ... | 30 |
| 11. | තද පස් ... | ... කියුබ් ... | 100 ... | 75 |
| 12. | මැටි ... | ... කියුබ් ... | 50 ... | 30 |
| 13. | බොරළු ... | ... කියුබ් ... | 200 ... | 200 |
| 14. | කැලිකට් මෝස්තරයේ උළු | ... ගණනින් ... | 7,500 ... | 7,500 |
| 15. | මුදුන් උළු | ... ගණනින් ... | 750 ... | 750 |
| 16. | සිංහල උළු ... | ... ගණනින් ... | 7,500 ... | 7,500 |
| 17. | 30'—40' උණගස් | ... ගණනින් ... | 200 ... | 200 |
| 18. | ලුණු මිදෙල්ල ලැලි | ... දික් අඩි ... | 7,500 ... | 7,500 |
| 19. | සීලිං fපිලට් පටි | ... දික් අඩි ... | 1,500 ... | 1,500 |
| 20. | සීලිං ලීස්තර | ... දික් අඩි ... | 750 ... | 750 |

සැළකිය යුතුයි : 1—ඉහත සඳහන් කොට ඇති ප්‍රමාණ ආසන්න වශයෙනි. ඒවා දැන්වීමක් නැතිව වෙනස් කිරීමට ඉඩ ඇත.

මනුනායකම් කුමාරස්වාමි,
අධිකාරී ඉංජිනේරු,
කොළඹ කොට්ඨාසය.

අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1355,
කොළඹ 7.

2–555—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම**

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම හා ගෙනගොස් භාරදීම සඳහා, පේරාදෙණියේ, ගන්නොරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 මාර්තු මස 19 වැනි දින ප.ව. 2.30 තෙක් මිල ගණන් භාරගනු ලැබේ :—

| ද්‍රව්‍ය අංකය | විස්තරය | ප්‍රමාණය | |
|---|---|---|---|
| (1) (ඒ) | ... සක්කගල් 4" | ... කියුබ් 30 යි | |
| (බී) | ... කැටගල් 3/4" | ... කියුබ් 40 යි | |
| (සී) | ... ගඩොල් | ... 15,000 යි | |
| (ඩී) | ... ගංගාවැලි | ... කියුබ් 30 යි | |
| (ඊ) | ... තම්බාපු හුණු | ... බුසල් 40 යි | |
| (2) පළවෙනි පන්තියේ දැව | | | |
| (ඒ) | ... 9"×1 1/2"×8 දිග ලැලි | ... ස්ක්වයර් අඩි | 180 යි |
| (බී) | ... 6"×4"×11 දිග බාල්ක | | 2 යි |
| (සී), | ... 6"×2"×12 දිග බාල්ක | | 4 යි |
| (ඩී) | ... 4"×2"×8 දිග | | 100 යි |
| (ඊ) | ... 2"×2"×12 දිග | | 115 යි |
| (එෆ්) | ... 8"×3/4" වඩිම්බු ලැලි | ... ස්ක්වයර් අඩි | 66 යි |
| තුන්වෙනි පන්තියේ ලැලි | | | |
| (ඒ) 1 1/2"×9"×8 දිග ස්කවයර් අඩි | | | 1,000 යි |

බණ්ඩාරවෙල හෝප් එස්ටේට් එකට සැපයීමට හා ගෙනගොස් භාරදීමට

(3) පී.වී.සී. පයිප්ප හා කොටස්

| | | |
|---|---|---|
| (ඒ) විෂ්කම්භය 6" පී.වී.සී. පයිප්ප සොකට් සමග දික් අඩි | 500 යි | සැපයීමට පමණයි |
| (බී) විෂ්කම්භය 5" පී.වී.සී. පයිප්ප සොකට් සමග දික් අඩි | 1,600 යි | |
| (සී) විෂ්කම්භය 4" පී.වී.සී. පයිප්ප සොකට් සමග දික් අඩි | 1,900 යි | |
| (ඩී) විෂ්කම්භය 3" පී.වී.සී. පයිප්ප සොකට් සමග දික් අඩි | 2,200 යි | |
| (ඊ) විෂ්කම්භය 2" පී.වී.සී. පයිප්ප සොකට් සමග දික් අඩි | 5,600 යි | |
| (එෆ්) පී.වී.සී. අඩුකිරීමේ සොකට් 5"×3" | 4 යි | |
| (ජී) පී.වී.සී. සමාන ටී 4" සොකට් සමඟ | 1 යි | |
| (එච්) පී.වී.සී. සමාන 3" සොකට් සමඟ | 4 යි | |
| (අයි) පී.වී.සී. අඩුකිරීමේ ටී 3"×2" සොකට් සමඟ | 4 යි | |
| (ජේ) පී.වී.සී. අඩුකිරීමේ 5"×2" සොකට් සමඟ | 5 යි | |
| (4) (ඒ) ඇල්කතීන් පයිප්ප 2" දික් අඩි | 800 යි | |
| (බී) රබර්හෝස් 1" දික් අඩි | 500 යි | |
| (සී) සිකා ගැලුම් | 5 යි | |
| (ඩී) සොල්වන්ට් සිමෙන්ති නො. 10 ප්‍රමුඛත්වය ග්‍රෑම් 500 ටින්, ප්‍රමාණය කිලෝග්‍රෑම් 20 | 40 යි | |
| (5) (ඒ) 2" යකඩ ඇන හොණ්ඩර | 2 යි | |
| (බී) 3" යකඩ ඇන හොණ්ඩර | 1/2 යි | |
| (සී) 4" යකඩ ඇන හොණ්ඩර | 1/2 යි | |
| (ඩී) 5" යකඩ ඇන රාත්තල් | 25 යි | |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හෝ එහි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරන ලද නියම තත්වයන් අනුව තිබිය යුතුය.

3. ටෙන්ඩර්කරුවන්ට මින් කොටසකට හෝ සම්පූර්ණයෙන් හෝ ටෙන්ඩර් කල හැක.

4. දෙපිටපතකින් සකස් කරණ ලද මිල ගණන් සඳහන් ලැයිස්තු හොඳින් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා '' ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිල ගණන් කැඳවීම '' යන්න කවරය පිට පැත්තේ සඳහන් කර, සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉංජිනේරු අංශය, ගන්නොරුව පේරාදෙණිය යන ලිපිනයට, 1973 පෙබරවාරි 19 වැනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

5. සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් අවසාන කරණ ලද දිනයේ සිට දින 40ක කාලයක් තුල භාරගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ ඉන් කොටසක් හෝ භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ, ගන්නොරුවේ, කෘෂිකර්ම ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු).

කෘෂිකර්ම ඉංජිනේරු අංශය,
යාන්ත්‍රික වැඩපල,
ගන්නොරුව. පේරාදෙණිය,
1973 පෙබරවාරි මස 5 වැනි දින.

2–583—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

ටෙන්ඩර් අංකය : එම්.ටී./3/727304

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

නැප්සැක් පවර් ස්ප්‍රේයර් 100 ක් සැපයීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 73.3.7 වෙනි දින ප.ව. 1.30 තෙක් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සැපයීම් විස්තර | අවශ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| එම්.ටී/3/727304 ... | නැප්සැක් පවර් ස්ප්‍රේයර් ... | 100 |

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ඉංජිනේරු අංශයේ) නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළයුතුය.

3. අපේක්ෂිත ටෙන්ඩර් කරුවන්ට ඉහත 1 වෙනි ඡේදයෙන් සඳහන් සියල්ලටම හෝ ඉන් කොටසකට ටෙන්ඩර් කළහැකිය.

4. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළයුතු අතර එම පිටපත් නිසියාකාරව සම්පූර්ණකර අත්සන් තබා සීල් තැබූ කවරයක බහා එහි වම් උඩ කෙලවරේ ''නැප්සැක් පවර් ස්ප්‍රේයර් සඳහා ටෙන්ඩර් අංක එම්ටී/3/727304 භාර ගැනීමේ අවසාන දින 73.3.7 ප.ව. 1.30'' යන්න සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

5. 73.3.5 වෙනි දින ඇතුළුව එතෙක් පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මීට පසු ටෙන්ඩර් පත් නිකුත් කරනු නොලැබේ.

6. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක්වීදි ශාඛාවේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ අංක 37 දරණ ගිණුමේ අයට මුදල් තැන්පත් කිරීමෙන් හෝ ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සියක් මත පමණයි.

7. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම ටෙන්ඩර් පතකින් කොටසක් හෝ සම්පූර්ණ එකම භාරගැනීමේ හිමිකම රජය සතුවේ.

8. වැඩිමනත් විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකියි.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 පෙබරවාරි මස 5 වෙනි දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු කාර්යාලයේ දීය.

2–582—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

වත්තේගම නගරය

නිවාස ඉදි කිරීම සහ කාණු ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් කර්මාන්ත කිරීම සඳහා 1973.01.23 දින දක්වා රජයේ හෝ පළාත් පාලන ආයතනවල ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

පළමුවැනි කර්මාන්තය සඳහා රු. 20,000 ක් හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් ද, දෙවැන්න සඳහා රු. 5,000 ක් හෝ ඊට වැඩි වටිනාකමකින් ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද සීල් තබන ලද ටෙන්ඩර් පත් මවිසින් භාර ගනු ලැබේ.

| කර්මාන්තය | ටෙන්ඩර් ඇප මුදල රු. | ශ. | | පෝර්ම ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|---|---|
| (1) දෙල්හගලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 6 ක් ඉදි කිරීම | 200 | 0 | ... | 10 | 0 |
| (2) බාලිකා විද්‍යාල භූමිය මැදින් යන අපද්ධ කාණුව සෑදීම | 150 | 0 | ... | 10 | 0 |

වැඩි විස්තර කායර්ාලයෙන් ලබාගත හැක.

එස්. බී. දෙළපිහිල්ල,
විශේෂ කොමසාරිස්,
වත්තේගම නගරය.

1973 ජනවාරි මස 17 වෙනි දින,
වත්තේගම විශේෂ කොමසාරිස් කායර්ාලය.

2–631—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

යොමුව : පීඇස්ඩී. 1/76/72.

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

#### මිනුම් වීදුරු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මිනුම් වීදුරු සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ:—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස් පාර, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.3.27 වැනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම් වලින්,

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදි රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

1973 පෙබරවාරි මස 1 වැනි දින,
කොළඹ.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Measure Glasses Conical shaped capacity 250 ml./10fl. ozs. graduated both in millilitres and fluid ounces as follows: 10 ml./⅓fl. ozs. | 3,600 only .. | In any convenient packing |
| 2 .. | Measure Glasses Conical shaped capacity 500 ml./20 fl. ozs. graduated both in millilitres and fluid ounces as follows:— 50 ml./1 fl. ozs. | 3,600 only .. | do. |

2–549—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### පුත්තලම් කච්චේරිය

පුත්තලම් දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973.03.01 වැනි දින දහවල් 12 තෙක්, මුද්‍රා තබන ලද ටෙන්ඩර්, පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ :—

1. පුත්තලම හා හලාවත රජයේ නිවාසවලට ජල මුද්‍රා වැසිකිළි තැනීම.

2. පුත්තලමේ දිසාපති වෙතින් 1973. 02. 28 වැනි දින පස්වරු 3 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්වල, පිටපත් 2 ක් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අදාල සියළුම විස්තරද ඔහුගෙන් ලබාගත හැක. රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි ව ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා ග්‍රාම සංවර්ධන සමිති, සමූපකාර සමිති වැනි අනුමතිය ලත් සමිතිවලටද පමණක් ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත. එක් එක් වැඩට රු. 10 බැගින් වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් වෙනුවෙන් කච්චේරි කුවිතාන්සි ඉදිරිපත් කරන් අයට ටෙන්ඩරපත් නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති හා සමූපකාර සමිති වැනි අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස් ය.

3. ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ටෙන්ඩර්පත් බහාලන ලියුම් කවරයේ "රජයේ නිවාසවලට ජල මුද්‍රා වැසිකිළියක් තැනීම" යනුවෙන් සඳහන් 1973. 03. 01 දින දහවල් 12 ට ප්‍රථම පුත්තලමේ දිසාපති වෙත ලැබෙන සේ එවිය යුතුය. මෙදින මෙම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. 1973. 03.02 වැනි ප. ව. 3 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට ඉඩදෙනු ලැබේ. කොන්ත්‍රාත්තුවේ මුදලින් සියයට පහ (5%) ක් වශයෙන් ගණන් බලන ලද මුදලක් තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇප වශයෙන් බැඳ ගිවිසුම අත්සන් කළ යුතු ය. තෝරාගනු ලබූ ටෙන්ඩර්කරුට ඒ බැව් දන්වා දින 10 ක් ඇතුලත එසේ කිරීමට ඔහු ඉදිරිපත් නොවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වන්නේ ය.

5. නිම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) සඳහා පමණක් මුදල් ගෙවා, ඇපමුදල සමග ඉතිරි සියයට ප්‍රමාණය වැඩ අවසන් කර මාස 3 ක් ඉක්ම ගිය පසු ගෙවනු ලැබේ.

බ. සු. විජේවීර,
පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති.

1973. 02. 01 වැනි දින,
පුත්තලම කච්චේරියේ දී ය.

2–550—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## බඩුබාහිරාදිය විකිණීම

### ද සොයිසා කාන්තා රෝහල—කොළඹ

#### ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙතෙක් හිමිකම් නොදක්වන ලද රෝගීන්ගේ දේපොල, යටතේ ගැනෙන පහත දක්වෙන භාණ්ඩ 1973 මාර්තු මස 28 වන දින පෙරවරු 10 ට කොළඹ ද සොයිසා කාන්තා රෝහලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ජයග්‍රාහක ලන්සුකරු විසින් වෙන්දේසිය අවසානයේදී ම මුළු මුදලම ගෙවා රෝගීන්ගේ දේපොල ඉවතට ගෙන යා යුතුයි.

3. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඕනෑම ලන්සුවක් ප්‍රතික්ෂේප කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට බලය ඇත.

4. දේපල වලට හෝ මුදල් වලට හිමිකම් කියන්නවුන් ඇත්නම් මෙම ගැසට් නිවේදනය නිකුත්වී දින හත (7) ක් ඇතුලත හිමිකම් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් හිමිකම් නොකියන මුදල් ආදායමට බැර කරන අතර, හිමිකම් නොකියන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

5. වැඩි විස්තර ද සොයිසා කාන්තා රෝහල් වෛද්‍ය අධිකාරිගෙන් දැනගැනීමට පුළුවන.

එස්. ඩී. එම්. ප්‍රනාන්දු,
අධිකාරි, කොළඹ රෝහල් මණ්ඩලය.

1973 ජනවාරි මස 30 වැනි දින,
කො. රෝ. ම. අ. කාර්යාලයේ,
මුදල් අංශයේ දී ය.

**රෝගීන් සතු මෙතෙක් ඉල්ලුම් කර නොමැති ද්‍රව්‍ය ලැයිස්තුව**

| | රෝගියාගේ නම | රෝහලට ඇතුළු වූ දිනය | රෝගියාගේ විස්තර | දේපල අංකය | මුදල් | ඉල්ලුම් නොකළ දේපල |
|---|---|---|---|---|---|---|
| 1. | ඇම්පො නෝනා මිය. | 1952. 2. 4 | මියගොස් ඇත | 2/1956 | නැත | රන්වන් අරුංගල් ජෝඩුවක් (1) |
| 2. | පුංචිනෝනා මිය. | 1956. 2. 7 | එම | 3/1956 | නැත | (අ) රිදීපාට වලලු ජෝඩු තුනක් (3)<br>(ආ) රිදී වලල්ලක් (1)<br>(ඇ) තඹ මුදු තුනක් (3)<br>(ඉ) රන්වන් සූර එකක් (1)<br>(ඊ) රන්වන් කරාබු ජෝඩු එකක් (1) |
| 3. | ජී. රොස්ලින් නෝනා මිය. | 1959. 4.27 | එම | 17/1959 | නැත | (අ) රන්වන් කරාබු ජෝඩුවක් (1)<br>(ආ) රිදීපාට වලලු ජෝඩුවක් (1) |
| 4. | පුංචිමැණිකේ මිය. | 1959.11. 2 | එම | 22/1959 | — | රන්වන් කරාබු ජෝඩුවක් (1) |
| 5. | ඇලිස් සෙනෙවිරත්න මිය. | 1964. 3.14 | එම | 29/1964 | — | රන්වන් කරාබු ජෝඩුවක් (1)<br>(තඹ පාට පෙත්ත සහිත) |

2–552—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**මහ රෝහල—කොළඹ**

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

